**ආගමික ප්‍රචණ්ඩත්වයට සහ ආතතියට මුහුණ දීම සඳහා දැන් ප්‍රබල ක්‍රියාවත් වග වීමත් අවශ්‍ය ය**

මුස්ලිම් පූජනීය ස්ථානවලට හා ව්‍යාපාරවලට මෑතක දී එල්ල කරන ලද ප්‍රහාර හා තර්ජන පිළිබඳව ද ඉස්ලාම් ආගමට එරෙහිව යොදා ගැනෙන ප්‍රකෝපකාරී හා අපවාදාත්මක වාගාලාප පිළිබඳව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) අතිශයින් ම සැලකිලිමත් ය. මෙම ක්‍රියාවන් මුළුමනින් ම හෙළා දකින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඒවාට වගකිව යුත්තන් ලවා පමාවකින් තොරව වග වීමට සලස්වන ලෙස හා පමාවකින් තොරව එවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා පියවර ගන්නා ලෙස ආණ්ඩුවෙන් ද නීතිය බලාත්මක කරන ආයතනවලින් ද ඉල්ලා සිටී. එසේ කිරීමට අසමත් වුව හොත් වෛර කිරීමේ හා හානි කිරීමේ දේශපාලනයත් දඬුවම් නොලැබීමේ සංස්කෘතියත් පෝෂණය වනු ඇති අතර අපගේ පුරවැසි සගයන් 2015 දී මේවා පැහැදිලි ලෙස ම ප්‍රතික්ෂේප කළ බව කිව යුතු ය.

දවසේ අවශ්‍යතාව වන්නේ අප රටේ සියලු ජනතාවන් අතර ප්‍රතිසන්ධානය, සාමය හා මිත්‍රත්වය යි. වෛරයට හා බෙදීමට කිසිදු ඉඩක් නො පවතී. ආණ්ඩුව අවංක ලෙස හා ක්‍රියාකාරී ලෙස ප්‍රතිසන්ධානය උදෙසා ක්‍රියා කළ යුතු ය. එය සමාජය තුළ බෙදීම් පවත්නා බව පිළිගෙන ඒවා සුවපත් කිරීම සඳහා සහ තව දුර බෙදීම් ඇති වීම වැළැක්වීම සඳහා ප්‍රජා මට්ටමින් හා ජාතික මට්ටමින් යන්ත්‍රණයන් ඇති කළ යුතු ය. එපමණක් නො ව, භීතියකින් හෝ අනුග්‍රහ දැක්වීමකින් තොරව, බෙදීම් හා වෛරය ඇති කරන්නන්ගේ අනන්‍යතාව නො තකා රටේ නීතිය සියල්ලන්ට ම සමානව අදාළ විය යුතු බව යහපාලන මූලධර්මවලින් කියැවේ. පාලනයකින් හා දඬුවම් ලැබීමකින් තොරව එවැනි ක්‍රියාවන් සිදු වී ගෙන යාමට ඉඩ දුන හොත් මේ රටට අවශ්‍ය කරන සාමයේ හා සමෘද්ධියේ ප්‍රගතිය බරපතළ ලෙස පමා වනු ඇත.

පවත්නා නීතිමය රාමුව එවැනි සිදුවීම් වළක්වා අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීමට නීතිය බලාත්මක කරන බලධාරීන්ට ප්‍රමාණවත් මෙවලම් සම්පාදනය කරන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත නැවතත් කියා සිටී. නීතිය බලාත්මක කරන බලධාරීන් වෙනත් ආකාරවල සාමකාමී විරෝධතා හා එක්රැස් වීම් වැළැක්වීම හා මැඩ පැවැත්වීම සඳහා පවත්නා නීතිමය තන්ත්‍රය යොදා ගන්නා නමුත් මෙම ප්‍රහාරවලට වගකිව යුතු අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීමේ දී ඊට සමාන උද්‍යෝගයක් හා කාර්යක්ෂමතාවක් පෙන්නුම් කිරීමට එක දිගට ම අසමත් වීම අතිශයින් ම කනස්සල්ලට කරුණකි.

සියලු ජනවර්ගවලට හා ආගම්වලට අයත් අපගේ පුරවැසි සගයන්ගේ සහාය ඇතිව බලයට පත් ජනාධිපතිවරයා සහ වර්තමාන ආණ්ඩුව මෙම තැති ගන්වනසුලු වූත් මාරක වූත් ප්‍රවණතාව නතර කිරීම සඳහා ධෛර්යයෙන් හා දූරදර්ශී භාවයෙන් යුතුව ක්‍රියා කළ යුතු ය. අපගේ එක ද පුරවැසි සගයෙකු වත් භීතියෙන් ජීවත් නො විය යුතු ය, ආගමික පදනමක් මත හෝ වෛරය සපයන්නන් විසින් හිතාමතා ඔවුන්ට එරෙහිව පතුරන බෙගල් නිසා අපයෝජනයට හෝ ප්‍රචණ්ඩත්වයට ගොදුරු නො විය යුතු ය.

මේ ආණ්ඩුව කඩිනමින් ද කිසිදු සැකයකට ඉඩ නො තබා ද ක්‍රියා කළ යුතු ය. තමන් පෙනී සිටින්නේ තමන් යටතේ සිටින සියලු ජනයා සඳහා සාමයෙන්, මිත්‍රත්වයෙන් හා සුරක්ෂිතතාවෙන් යුතු එක්සත් ශ්‍රී ලංකාවක් උදෙසා බවට එය වචනයෙන් හා ක්‍රියාවෙන් පැහැදිලි වූත් ස්ථිරසාර වූත් පණිවුඩයක් යැවිය යුතු ය.